ආයුර්වේද සම්බාහන ආයතනයක් වෙසින් පවත්වා ගෙන ගිය ලිංගික සේවය ලබාදෙන ස්ථානයක් පොලිසිය මඟින් වැටලීම පිළිබඳ පුවතක්, දිනමිණ පුවත්පතේ (ඔක්. 06, 2022) පළ වී තිබිණි. මෙම පුවත් සිරස්තලය සහ අන්තර්ගතය තුළ, අත්අඩංගුවට ගත් ලිංගික ශ්‍රමිකයින් පිළිබඳව සඳහන් වී තිබුණේ, "සුරූපිනියන්", "සුරූපී කාන්තාවන්" යන යෙදුම් භාවිතා කරමිනි. එසේම ඔවුන් "ගණිකා වෘත්තියට" පැමිණ ඇති බවද සඳහන්ව තිබිණි.

1) මෙම තැනැත්තියන්ගේ බාහිර රූපය පුවතට සෘජුව අදාළ වේ යැයි ඔබ සිතන්නේ ද? එසේ අදාළ නොවන්නේ නම්, එවැනි විශේෂණයන් ඔස්සේ ඔවුන්ව හඳුන්වන්නේ මන්ද?

2) එසේ බාහිර රූපය ඔස්සේ එම කාන්තාවන්ව හැඳින්වීමෙන්, මෙම සිදුවීම භාවාතිශය (sensational) ලෙසකින් දැක්වේ යැයි ඔබ සිතන්නේ ද? එසේම එය ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කාන්තාවන්ව ඒකාකෘතික කිරීමක් ද (stereotyping) නොවන්නේ ද?

3) "ගණිකාව", "ගණිකා වෘත්තිය" සම්බන්ධයෙන් සමාජයේ ඇති ගර්හාව නිසා, ඔවුන්ට සමාජයෙන් එල්ල වන කොන් කිරීම අවම කිරීම සඳහා, "ලිංගික ශ්‍රමිකයා", "ලිංගික සේවය" වැනි යෙදුම් වඩාත් උචිත නොවන්නේ ද?

පුවතට අදාළ නොවන බාහිර රූපය ඉස්මතු නොකරමු!